

# සිනුවර හසුන

**සිඩ්නි සිට ලියමි**

සිරිලකේ සිට ඔසී රටට සංක්‍රමණය කරන්නට වරම් ලැබූ කාලයේ මා සතුව විකල්ප දෙකක් තිබුනි. එකක් මෙල්බර්නයට පැමිණීමය. දෙවැන්න සිනුවර ට පැමිණීමය. ප්‍රධාන නගරය වූ නිසා සිනුවරට හිත ඇදේ. මිතුරන් වැඩි පිරිසක් සිටි නිසා මෙල්බර්නයට සිත ඇදේ. කොහේ යන්නදැයි තීරණය කිරීම උභතයෝකෝටික ප්‍රශ්ණයක් විය.

දෙපොලම බලා කියා ගෙන නිසි තීරණයක් ගන්නට සහ ඊටත් වඩා සුතනඹුවන් ට වීසා වරම් ගන්නට මහ කොමසාරිස් කන්තෝරුව විසින් ඇති කරවන ලද අවශ්‍යතාවය නිසා මා ටික දිනකට යැයි සිතා මුලින් ම මෙල්බර්නයට ගොඩ බැස්සෙමි. නොසිතූ ලෙස කොන්තරාත්තුවක පැටලීම නිසා වාසනාවකට මෙන් මගේ මෙල්බර්නයේ වාසය සති කිහිපයක් දක්වා දිගු වූ අතර, එනිසා ම අවාසනාවකට මෙන් සිනුවර වාසය දින කිහිපයකට පමණක් සීමා විය.

කෙසේ වෙතත්, ටික දිනකට පසුව, පවුල් පන්සල් පිටින් මා සිරිලක සිට මෙල්බර්නයට සංක්‍රමණය වූයේ යහළු මිත්‍රාදීන් වැඩි සාන්ද්‍රණයක් එහි සිටි නිසා යැයි කීම නිවරදි වේ. එනිසාම, වසර හයක් මෙල්බර්නයේ වාසයෙන් පසු, සිනුවර බලා දේශීය වූ සංක්‍රමණයක් කිරීමට හිත හදා ගැනීම පෙර දිනක ක්ෂිතිජය තරණය කිරීමටත් වඩා අසීරු එකක් විය.

මා මෙල්බර්නයේ කාලය ගත කරන අතර, සිනුවර ගැන ද, සිනුවර වාසී සිංහලයන් ගැන ද ලැබුනේ එතරම් ප්‍රසාදය උපදවන ආරංචි නොවේ. සිනුවරු, අධික වූ නිවාස උගස් ණය බරින් පීඩිත බවත්, එනිසාම, මෙල්බර්නයේ සගයන් සමග දුරකතන බිල් ගෙවමින් සම්බන්ධතා පවත්වනවා තියා, සිනුවරුන් අතර වත් දැඩි මිතුදම්, සාද, ප්‍රිය සම්භාෂණ නැති තරම් බවත් පතල වී තිබුනි. මෙල්බර්න් මිතුරන් පිරිසක් සිනුවර බැලීමට පැමිණි සඳ, පැරණි ප්‍රාණප්‍රිය සිනුවර මිතුරෙකු ඔවුන්ව අතේ පැලවෙන බොරු කියා ඔවුන්ව මග හැරීම, ඉහත කී සිනුවර සහ සිනුවරුන් පිළිබඳ අපේ ඌණ ප්‍රසාදය කිසිසේත්ම මගහරවන හේතුකාරකයක් නම් නොවීය.

කෙසේ වෙතත් දෛවෝපගතව මා අද සිනුවර වසමි. සිනුවර ට ඇළුම් කරමි. සිනුවර ට ම කඹුටමි. සිනුවරෙකු වී ඇත්තෙමි. සිනුවරෙන් අභිනිෂ්ක්‍රමණය කරන්නට හිතක් නැත්තෙමි.

අද එසේ වුවද, වසර හතකට ඉහත මෙල්බර්නයේ සිට සිනුවර බලා අභ්‍යන්තර සංක්‍රමණය කළ කාලයේ මගේ චෛතසිකය එසේ නොවීය.

මා සිනුවර වසන්නට ගිවිසුම් අත්සන් කර මෙහි ගොඩ බැස්සේ හරියටම සත්වසරකට පෙර 2001 නොවැම්බරයේ දී ය. මින් පෙර දෙවතාවක දින කිහිපයක් බැගින් විවේකය ගත කර තිබුනද, සිනුවර ගැන මා දැනුම අල්ප විය. එනිසාම, මුල් වරට සාප්පු ගිය ද මට රිය නැවතුමේ ස්ථානයක් සොයා ගැනීමට අඩ හෝරාවක් ගත වුනි. චැඩ්ස්ටනයේ සුවිසල් සාප්පු සංකීර්ණයේ මා ලද අත්දැකීම් හිරු දුටු කදෝ පැණියෙකු සේ මිලානව ගියේය.

පසුදා සේවයට යාමට මගට බට මා පටු මාවත් වල සෙමින් ඇදෙන මෝටර් රථ ඔස දහරේ පැය ගණනක් පාවෙමින් ලතවෙන තවත් එක් මාතලී පුත්‍රයෙක් බවට පත් වීමි. පෙර දින මා නිදහස් මහා මාර්ගයේ නැගෙනහිර දෙස සිට එක පිම්මේ විත් මෙල්බර්නයේ රාජකීය මගේ පැය පහක් නොමිලයේ ම වාහනය ගාල් කල අයුරු සිහිනයක මතකයක් පමණක් විය.

මේ සුවිසල් සිනුවර මා එක් ක්ෂුද්‍ර ජීවියෙක් පමණක් බව මට සැනෙන් පසක් විය.

ඒ කෙසේ වෙතත්, සමහර විටක ඒ නිසාම, කල් යත්ම මා සිනුවරට ඇළුම් කරන්නට පටන් ගත්තෙමි. අධික උගස් ණය බර, මාර්ග තදබදය අද මට හොඳින් හුරුය. ස්කන්ධයෙන් හෝ වෙනත් මානයන්ගෙන් කෙසේ වෙතත්, අනුපාතයෙන් එක හා සමාන වූ හේතු නිසාම, කන්ද උඩරට මහනුවර සිට කොළොම් තොට ට පැමිණෙන්නෙකු ද මුලින් මෙවැනි අපේක්ෂා භංගත්වයකටත්, දෙවනුව මෙවැනිම වූ චෛතසික පරිවර්තනයකටත් පත්වෙන්නට හොඳටෝම ඉඩ ඇත.

පර්ත් ගම්මානයේ සිටින මිතුරෙකුට සිනුවර සිරි වනමින් මා ලියූ කවි පෙලක අවසාන කවෙන් අද මේ කොලම අවසන් කිරීම සුදුසුයැයි සිතමි.

නුවර පර්ත් සිට නුඹ දුක් විඳින්නේ
කවර පවින් දෝ මා නම් නොදන්නේ
පවර සිනුවරේ පුර සඳ දිලෙන්නේ
මිතුර පින් කරපු අයටය පෙනෙන්නේ

සිනුවර පිළිබඳ තවත් තොරතුරු රැගත් "සිනුවර හසුන" සමග ලබන මාසයේ නැවත හමුවෙමු.

**සිනුවර ආරච්චිල**

<sinuwara.arachchila@gmail.com>



# මාධ්‍ය නිදහස

වාණිජකරණය වූ සමාජයක ගුණාත්මක දෑ වලට හිමි වනුයේ දෙවැනි තැනය. ඇස ගැටෙන, කණ වැටෙන සියළු දෑ හෝ බොහෝ දෑ වෙත වාණිජමය අගයක් ලබා දීම එවන් සමාජයක ලක්ෂණයයි. එහෙත් සදාචාරාත්මක ගුණධර්ම පිළිබඳව, හැදියාව පිළිබඳව පුන පුනා කියමින් යහපත් සමාජයක අවශ්‍යතා ගැන නිතර, සුළු පිරිසක් කතිකාවතක යෙදෙන අයුරු දක්නට ලැබීමත් එවන් සමාජයක තවත් ලක්ෂණයක් යයි සූක්ෂමව බලා හිඳින්නන්ට දැක ගත හැකි වනු ඇත.

ශ්‍රී ලංකාව වාණිජ රැල්ලට හසුව ගසා ගෙන යන්නේද?

එසේ නම් සුළු පිරිසක් සැමදා යෙදෙන කතිකාවත බහුතරයක් වෙත ගෙන යාමේ වගකීම ඇත්තේ කාටද?

නිසැකවම, පවතින රාජ්‍යයට මෙහි මූලික වගකීම ඇතැයි, කුඩා පාසැල් දරුවන් පවා පවසනු ඇත. පවතින ආණ්ඩුවේ සිට සාමාන්‍ය පුරවැසියා දක්වා ඇති වගකීම ආරෝහණ, අවරෝහණ ක්‍රමයන්ට බෙදා ගත යුතුය. අඩුවැඩි වශයෙන් දැරිය යුතු වගකීම් සහ යුතුකම් අනුව ඇස, කණ රවටන ජනමාධ්‍යය කෙරෙහි අද වන විට දැඩි වගකීමක් ඇතැයි චෝදනා එල්ල වීම සාධාරණය. මන්ද යත් මිනිසාගේ සිතුම් පැතුම් හසුරවන්නට ජනමාධ්‍යයට ඇති හැකියාව පුදුම සහගතය. අප කන්නට, බොන්නට අවශ්‍ය දේත්, අඳින්නට අවශ්‍ය දේත් කියා දෙන්නේ ජනමාධ්‍යයයි. අපේ සිහිනයන් වගා කොට දෙන්නේ ද ජනමාධ්‍යයයි. කැටි කර කියන්නේ නම් අපට අද වන විට ජීවත් වන්නට කියා දෙන්නේ ජනමාධ්‍යයයි. එතරම්ම එය අපට සමීපව ඇත. හොඳට, නරකට දෙකට කටමය පිරුළ වෙනස් කොට, හොඳට නරකට දෙකට ජනමාධ්‍යය යයි කීව ද කමක් නැත. ඉන් රූපවාහිනිය ඉතා ප්‍රබල ස්ථානයක රැඳෙමින් මිනිසා පාලනයට නතු කරගන්නා ආකාරය අපූරුවට දැක ගත හැකිය. විශ්මයට කරුණ වන්නේ නරක ද හොඳට ගනිමින් බොහෝ දෙනා වල්මත් වීමයි. වර්ණවත් දෑ තුළ සිත් කුළු ගන්වා එහි අතරමං කර දැමීම පිළිබඳව රූපවාහිනි නාලිකා වලට දොස් කිව නොහැකි මුත් මානව දයාව විනාශ කරන්නා වූ බොහෝ දර්ශන අඩංගු විවිධ නිපැයුම් හේතුවෙන් දරුණු සිත් ඇති, වෛරයෙන්, ද්වේශයෙන් පිරුණු සමාජයක් ගොඩ නගන්නා වූ අනිසි ක්‍රියාදාමයට නම් චෝදනා එල්ල කළ යුතු වේ.

මේ දින වල මාධ්‍ය වාරණ, නීති රීති පිළිබඳව අසන්නට ලැබෙන දෑ බොහෝය. එහෙත් සිදු විය යුත්තේ කුමක්දැයි කිසිවෙකු නොදන්නවා නොවේ. බොහෝ විට ආර්ථිකමය වාසි හේතුවෙන් කිසිදු ප්‍රමිතියකට නතු නොවන දෑ විකාශය කරමින් සමාජය විනාශ කර දමමින් සිටීමේ වැඩි වගකීම රූපවාහිනී නාලිකා දැරිය යුතුය. පවතින රජය හෝ අදාළ අමාත්‍යංශය විසින් කළ යුතු වන්නේ එම ආයතනයන්හි බාහිර දෑ පිළිබඳව වැටකොටු බැඳීම නොව, ඉන් සමාජයට දෙන්නා වූ අහිතකර, අනවශ්‍ය, නොහොබිනා වැඩ සටහන් වලට වැටකොටු බැඳීමයි. එහි ප්‍රමිතිය රැක ගැනීමට අවැසි තහංචි සම්පාදනය කිරීමයි. නැතහොත්, ගුණාත්මක වැඩ සටහන් නිෂ්පාදනය සඳහා අත්වැල් සැපයීමයි.

සමාජයක දියුණුව තීරණය වනුයේ එම සමාජය තුළ ජීවත් වන්නා වූ උගත්, බුද්ධිමත් සහ කලාකාමී රස වින්දනයක් ඇති ජනතාව තුළිනි. ඒ වෙනුවට උගත්කම පමණක් සහ දරුණු මිනිසුන් බිහි වීමෙන් එම සමාජය දියුණු නොවේ. මේ සඳහා රූපවාහිනියට කළ හැකි දෑ බොහෝය. වැඩ සටහන් සම්පාදනය පිළිබඳව එම ආයතන ප්‍රධානීන් සැළකිල්ලක් නොදක්වන්නේ නම් හෝ ඒ පිළිබඳව නිසි අවබෝධයක් ඔවුනට නැත්තේ නම් එසේත් නොවී, මුදල් මත පමණක් පදනම්ව ඕනෑම පහත් මට්ටමේ වැඩසටහන් විකාශය කරන්නේ නම් රටේ වගකිව යුතු පුද්ගලයා මීට මැදි විය යුතුය. එමෙන්ම විද්වතුන්ගේ අදහස්, යෝජනා සැළකිල්ලට ගනිමින් යම් ප්‍රමිතියක් සකස් කර ගත යුතුය.

අද වන විට ඇස, කණ නොනිසි අයුරින් පිනවා මිනිසාගේ පහත් රස වින්දනය පුබුදු කර සමාජය වැරදි මග යවමින් සිටින්නේ රූපවාහිනිය බව බොහෝ රූපවාහිනි නාලිකා දෙස බලා හිඳීමෙන් වටහා ගත හැකිය. ලිංගිකත්වය උලුප්පාලමින්, කාන්තාව වෙළඳ භාණ්ඩයක් ලෙස පරිහරණය කරමින් මුදල් උපයන්නන් රූපවාහිනිය අතකොළු කරගන්නා හැටි හාස්‍යජනකය. අවසන, දෙපිරිසම මුදල් උපයන්නෝම පමණක් වෙති.

යහපත් සමාජයක් ගොඩ නැගීම සඳහා යම් යම් නීති රීති මාලාවක් එම සමාජයට තිබිය යුතුය. මන්ද යත්, නිදැල්ලේ හැසිරීමට ඉතා කැමති මිනිස් සිත තෝරා ගන්නට බොහෝ විට කැමති වන්නේ ඉතා සරල හෝ ඊටත් පහළ මට්ටමේ රස වින්දනය වන බැවිනි. එනිසා ඉහළ රසඥතාවක් ඇති, වඩා බුද්ධිමත් පිරිසක් බිහිකරලීමේ ක්‍රියාදාමය එම සමාජය විසින් ගොඩ නගා ගත යුතුය.

විශේෂයෙන් ළමා වැඩසටහන් පිළිබඳව දැඩි සේ සැලකිලිමත් විය යුතු නොවන්නේද? හරවත්, දැනුම පෝෂණය කරන වැඩසටහන් වලට පමණක් අවසර දීමෙන් අනාගතය මීට වඩා බිඳුවකුදු හෝ යහපත් වේ යැයි සිතිය නොහැකිද? පිටරට වලින්

> **බොහෝ විට ආර්ථිකමය වාසි හේතුවෙන් කිසිදු ප්‍රමිතියකට නතු නොවන දෑ විකාශය කරමින් සමාජය විනාශ කර දමමින් සිටීමේ වැඩි වගකීම රූපවාහිනී නාලිකා දැරිය යුතුය. පවතින රජය හෝ අදාළ අමාත්‍යංශය විසින් කළ යුතු වන්නේ එම ආයතනයන්හි බාහිර දෑ පිළිබඳව වැටකොටු බැඳීම නොව, ඉන් සමාජයට දෙන්නා වූ අහිතකර, අනවශ්‍ය, නොහොබිනා වැඩ සටහන් වලට වැටකොටු බැඳීමයි. එහි ප්‍රමිතිය රැක ගැනීමට අවැසි තහංචි සම්පාදනය කිරීමයි. නැතහොත්, ගුණාත්මක වැඩ සටහන් නිෂ්පාදනය සඳහා අත්වැල් සැපයීමයි.**

ගෙන්වා ළමුන් සිත් තුළ තරගකාරී ලෙස වෛරය, ද්වේශය, එකිනෙකා පරයමින් යාමේ නොහොබිනා ගතිගුණ වගා කරන වැඩසටහන් වලට හඬ කවා ප්‍රචාරය කිරීම පිළිබඳව හැඟීමක්, වගකිව යුතු කිසිවෙකුට හෝ නොදැනෙන්නේ මන්ද? මේවායෙන් දරුවනට ලැබෙන පූර්වාදර්ශය කුමක්ද? එවැනි දෑ සොයා බලමින්, අනිසි දේ සඳහා තහංචි පැනවීමට අදාළ අමාත්‍යංශයට නොබියව යමක් තීරණය කළ නොහැකිද?

මනස පෝෂණය කරමින්, මානුෂික ගුණධර්ම වර්ධනය කරන්නා වූ,

නැතහොත් ආනන්දයෙන් ප්‍රඥාවට මිනිස් සිත හසුරවන්නා වූ වැඩසටහන් පිළිබඳව විමසිලිමත් වන්නට එම ආයතන බලධාරීන් දැනුවත් කිරීමද වටී.

සමහර රූපවාහිනි නාලිකා ඉතා සාරගර්භ වැඩ සටහන් ඉදිරිපත් කිරීම ආදර්ශයට ගනිමින් තුලනාත්තමක වැඩසටහන් සහ වෙළඳ දැන්වීම් ප්‍රචාරයට සැලසුම් සකස් කර ගැනීම තුළින් ඊළඟ පරපුර මීට වඩා අනෙකාට සංවේදී පිරිසක්ව හැඩ ගැසෙනු ඇත. යහපත් දරුවකු හදා ගැනීම ඕනෑම මවකගේ, පියෙකුගේ අරමුණ වන්නා සේම, යහපත් සමාජයක් බිහි කිරීම එරටේ ආණ්ඩුව සහ එරට වියතුන්ගේ අරමුණ ද, වගකීම ද විය යුතුය.

එමෙන්ම, ජනමාධ්‍ය නිදහස යනු මිනිසාගේ පහත් රස වින්දනය අවුස්සාලීමේ ක්‍රියාදාමයට අවසර පැතීම හෝ මන්දබුද්ධික සමාජයක් සඳහා ආම්පන්න සපයාදීමක් නොව, යහපත් පුරවැසියන් බිහි කරමින් ඉහළ රසඥතාව ඇති කිරීම සඳහාත්, සාධාරණ සමාජයක් වෙනුවෙන් නිදහසේ අදහස් එළි දැක්වීමේ නිදහසත් නොවේද?

**තුෂාරි ප්‍රියංගිකා**